# මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය

## *(2019 ජනවාරි මස 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා)*

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැවරී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව මුදල් කොමිෂන් සභාව විසින් සිය කාර්යයන් ඉටු කරනු ලබයි. මුදල් කොමිෂන් සභාව පිහිටුවීම සහ එහි කාර්යයන් හා වගකීම් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (ජ) වගන්තිය යටතේ අර්ථ දක්වා ඇත.

මෙම වාර්තාව මගින් 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ඉදිරිපත් කෙරේ.

### 1. පළාත් සභා සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම - 2020

තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම හා පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වේ.

2020 වර්ෂය සඳහා වූ නිර්දේශයන් සවිස්තරාත්මකව භාෂාත්‍රයෙන් සකස් කර 2019 සැප්තැම්බර් මස මුදල් කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශයන්ට ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ i) අරමුදල් පළාත් අතර තාර්කික ලෙස බෙදා වෙන් කිරීම සඳහා අවශ්‍ය අයවැය නිර්දේශ ලබා දීම හා ඒ අනුව පළාත් සභා සඳහා ප්‍රමාණවත් අරමුදල් රජයේ ප්‍රදාන හරහා ලබා දීම ii) රටේ ජනතාවගේ ඉහළ සමාජ-ආර්ථික තත්වයන් මගින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහ උප ජාතික මට්ටමින් සේවා සැපයීම සඳහා වන ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීමයි. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේදී හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන ප්‍රධාන ගැටළු සහ සීමාවන් මුදල් කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලබන අතර එවැනි ගැටළු අවම කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

2020 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ කැබිනට් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව (i) 2020 වර්ෂය සඳහා අයවැය සකස් කිරීමේදී නිර්දේශ සලකා බලන ලෙස මුදල් අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීම, ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දීම සහ ඉහත (i) තීරණයට යටත්ව එවැනි නිර්දේශ ලබා දීමට පියවර ගන්නා බවට පාර්ලිමේන්තුවට දැනුම් දීම යනාදිය 2019 ඔක්තෝබර් 29 දින පැවති කැබිනට් රැස්වීමේ තීරණය විය.

සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව විසින් ජාතික අයවැය සම්මත කිරීමෙන් පසු පළාත් සභා වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු මුදල් කොමිෂන් සභාව විසින් අදාළ පළාත් සභා වෙත දැනුම් දෙනු ලැබේ. නමුත් වාර්ෂික අයවැය වෙනුවට 2020 වර්ෂයේ පළමු මාස 4 සඳහා අතුරු සම්මත ගිණුමක් 2019 ඔක්තෝම්බර් 25 දින සම්මත විය. ඒ අනුව එම අතුරු සම්මත ගිණුම මගින් පළාත් සභා වෙත වෙන් වූ ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු හා නිර්දේශිත ප්‍රදානයන් පිළිබඳ තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා දන්වන ලදී.

### 2. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම - 2019

මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව පොදු හා ඵලදායි ව්‍යුහයකට අනුව සකස් කරන ලද වාර්ෂික සංවර්ධන සැලසුම් සියලුම පළාත් සභාවන්ගෙන් මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණි. මෙසේ එක් එක් පළාත් සභාව විසින් යොමු කරන ලද වාර්ෂික සංවර්ධන සැලැසුම් මුදල් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපති හා කොමිෂන් සභා සාමාජිකයින්, ලේකම් සහ අනෙකුත් අදාළ නිළධාරීන් සමඟ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කණ්ඩායමක් එක් එක් පළාත් සභාවන් හී වාර්ෂික සංවර්ධන සැලසුම්, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති හා ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන් පිළිබඳ සමාලෝචන සාකච්ඡා සඳහා සෑම පළාත් සභාවකටම සංචාරය කරන ලදී. මෙම සමාලෝචන රැස්වීම් සඳහා ප්‍රධාන ලේකම්වරු, පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීහු සහ පළාත් සභාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගි වූහ.

වර්ෂයේ පළමු කාර්තු දෙක තුළ, සියලුම පළාත් සභාවන් හී 2019 වර්ෂයයේ ක්‍රියාත්මක කිරීම සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කර අවසන් කරන ලද අතර සමාලෝචන රැස්වීම්වලදී එකඟ වූ පරිදි ඇතැම් සංශෝධනවලට යටත්ව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව එකඟතාවය ලබා දෙන ලදී.

## 3. ඉදිරි වර්ෂය සඳහා පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (පුනරාවර්තන හා ප්‍රාග්ධන)

එළඹෙන වසර සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන අරමුදල් අවශ්‍යතා පිළිබඳ තක්සේරු කිරීමට මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි. 2020 වර්ෂය සඳහා වූ පළාත් පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද සවිස්තරාත්මක මාර්ගෝපදේශ අවශ්‍ය ආකෘතීන් සමඟ 2019 පළමු කාර්තුවේදී පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යවන ලදී.

ඒ අනුව, මාර්ගෝපදේශයන් හී ඇතුළත් කර ඇති අවශ්‍යතා තක්සේරු කිරීමේ ආකෘතීන්ට අනුකූලව පළාත් පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම ඵලදායි ලෙස සිදු කර මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පළාත් සභාවලට හැකි විය.

## 4. පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම (පුනරාවර්තන හා ප්‍රාග්ධන)

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව, 2020 මුදල් වර්ෂය සඳහා ජාතික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් ලබා ගැනීම සඳහා පළාත් සභා සිය පුනරාවර්තන හා ප්‍රාග්ධන අයවැය අවශ්‍යතා ඉදිරිපත් කරන ලදී. තුන්වන කාර්තුව තුළ, සියළුම පළාත් සභා මගින් ඉදිරිපත් කරනු ලබන පුනරාවර්තන අයවැය අවශ්‍යතා පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලද අතර අවශ්‍ය පැහැදිලි කිරීම් සඳහා පළාත් සභාවල අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කරන ලදී. ඊට අමතරව රේඛීය අමාත්‍යාංශයන් හී කාර්ය මණ්ඩල යෙදවීම සහ මූල්‍ය අවශ්‍යතා පිළිබඳ තොරතුරු ද අවධානයට යොමු කරමින් පුනරාවර්තන අයවැය අවශ්‍යතා සඳහා සලකා බලන ලදී. එමෙන්ම, සියලුම පළාත් සභා සඳහා 2020 වර්ෂය සඳහා වූ පළාත් පුනරාවර්තන අවශ්‍යතාව සහ සාමූහික ප්‍රදාන යටතේ අවශ්‍යතාවය සමාලෝචනය කර අවසන් තීරණ කර එළඹීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සියළුම පළාත් සභාවල නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මුදල් හා අධ්‍යක්ෂ අයවැය සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් පැවැත්විය.

සියලුම පළාත් සභා වෙත මුදල් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව සහ අදාළ පළාත් සභාවල මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම් රාමුව තුළ ජාතික අයවැයෙන් අපේක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍යතාව ඉදිරිපත් කරන ලදී. අදාළ පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන අයවැය අවශ්‍යතාවය මුදල් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලද අතර ඒ සඳහා පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහ පළාත් අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් අවශ්‍ය ප්‍රධාන අංශ සඳහා රැස්වීම් සංවිධානය කරන ලදී. තවද, සියළුම පළාත්වල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (ක්‍රමසම්පාදන) සමඟ සියලුම අංශවල ප්‍රාග්ධන අරමුදල් අවශ්‍යතා පිළිබඳව පුළුල් සාකච්ඡා පවත්වා ජාතික අයවැය යටතේ පළාත් සභා වෙත අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍යතාවය නිගමනය කරන ලදී.

## 5. 2019 වර්ෂය සඳහා පළාත් සභා පරිපූරක අයවැය ප්‍රතිපාදන ලබා දීම (පුනරාවර්තන)

2019 වර්ෂය තුළ දී පළාත් සභා වෙත රු. මිලියන 14, 024 ක මුදලක් පරිපූරක පුනරාවර්තන අයවැය ප්‍රතිපාදන ලෙස නිර්දේශ කරන ලදී. ඉන් රු. මිලියන 3, 770 ක මුදලක් මුලින් වෙන් කරන ලද අතර ඉතිරි රු. මිලියන 10, 254 පළාත් සභා විසින් ඉල්ලුම් කර සිටි පරිදි පසුව නිර්දේශ කරන ලදී.

2019 වර්ෂයේ සිව්වන කාර්තුවේදී, උතුරු මැද පළාත් සභාව විසින් සාමූහික ප්‍රදානය යටතේ පරිපූරක අයවැය ප්‍රතිපාදන ලෙස රු. මිලියන 176.4 ක ඉල්ලීමක් සිදු කරන ලදී. කෙසේ වෙතත්, 2019 වර්ෂය සඳහා වන මූලික නිර්දේශයන්ට එය ඇතුළත් කර ඇති බැවින් මුදල් කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකරන ලදී.

## 6. පළාත් සභා කාර්ය මණ්ඩලය සමාලෝචනය කිරීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ මුදල් කොමිෂන් සභාව හා එක්ව පළාත් සභා සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව තක්සේරු කිරීමේ කාර්යය සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලියේදී, වර්ෂය තුළ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද රැස්වීම් 12 ක් සඳහා මුදල් කොමිෂන් සභාව සහභාගී වූ අතර පළාත් සභා හා ඒ යටතේ ඇති සෑම ආයතනයකම සේවක සංඛ්‍යා අවශ්‍යතා සමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම එහිදී සිදු කරන ලදී.

## 7. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා - 2017, 2018 සහ 2019

මුදල් කොමිෂන් සභාවේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කර 2019 ජනවාරි මස 29 වන දින මුදල් කොමිෂන් සභාවේ සභාපති යූ. එච්. පලිහක්කාර මහතා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් වන ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි, ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග, මහාචාර්ය එම්. එම්. සෆ්රුල්ලා, වී. කනගසභාපති මහතා ඇතුළුව මුදල් කොමිෂන් සභාවේ ලේකම් ඒ. ටී. එම්. යූ. ඩී. බී. තෙන්නකෝන් මහතා ද ඒම අවස්ථාව සඳහා සහභාගී වූහ. 2019 මාර්තු මාසයේ දී මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

මුදල් කොමිෂන් සභාවේ 2018 වර්ෂය සඳහා භාශාත්‍රයෙන්ම සකස් කරන ලද වාර්ෂික වාර්තාව සහ කැබිනට් සංදේශය සඳහා අවශ්‍ය, පහත සඳහන් ඇමුණුම් ත්‍රිත්වය සමඟ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා 2019 ජුනි 19 වන දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

- 2018 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව
- 2018 වර්ෂය සඳහා විගණන විමසුම් සහ නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
- කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා මුදල් කොමිෂන් සභාව අනුගමනය කළ යුතු මාධ්‍ය කාලීන ක්‍රියාමාර්ගවල සාරාංශය.

ප්‍රකාශන කාර්යය සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ සවිස්තරාත්මක වාර්ෂික වාර්තාව - 2018 භාෂාත්‍රයෙන් සකස් කර සම්පූර්ණ කරන ලද අතර මෙම වාර්තාවේ විද්‍යුත් අනුවාදය මුදල් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා පරිශීලනය කළ හැකිය.

ඒ අතරම, 2019 වර්ෂය සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සකස් කරමින් සිටින අතර එය තුන්වන කාර්තුව අවසානයේදී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

**8. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව**

මුදල් කොමිෂන් සභාවේ කාර්තුමය කාර්යසාධන වාර්තා නියමිත පරිදි ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසු පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. ඒ අනුව, 2018 වර්ෂය සඳහා වූ සිව්වන වන කාර්තුමය කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2019 වර්ෂය ආරම්භයේදී ව්‍යවස්ථාදායක සභාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

2019 වර්ෂය සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ පළමුවන කාර්තුමය කාර්යසාධන වාර්තාව 2019 ජූලි මස 04 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, මුදල් කොමිෂන් සභාවේ දෙවන කාර්තුමය කාර්යසාධන වාර්තාව ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු 2019 ඔක්තෝබර් 28 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ තුන්වන කාර්තුමය කාර්යසාධන වාර්තාව 2019 සැප්තැම්බර් 27 දින ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු 2019 දෙසැම්බර් 12 වන දින අනුමැතිය ලබා දෙන ලදී.

**9. මුදල් කොමිෂන් සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම**

රාජගිරිය, සරණ මාවතේ, අංක 03 දරණ ස්ථානයේ පිහිටා ඇති මුදල් කොමිෂන් සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ල අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම අවස්ථාව සඳහා ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමා, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා, ගරු පළාත් ආණ්ඩුකාරවරු, ගරු පළාත් ප්‍රධාන අමාත්‍යවරු, අනෙකුත් ආරාධිත අමුත්තෝ සහ නිලධාරිහු සහභාගි වූහ.

**10. මුදල් කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 බී සහ 154 ජ (1) (ඇ) වගන්තිය යටතේ 2018 නොවැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි, 2019 පෙබරවාරි 18 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් මුදල් කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් ලෙස පහත සාමාජිකයින් නැවත පත් කරන ලදී.

- සභාපති : උදිත හරිලාල් පලිහක්කාර මහතා
- සාමාජික : වී. කනගසභාපති මහතා
- සාමාජික : මහාචාර්ය එච්. එම්. සෆ්රුල්ලා

මීට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) (1) (අ) සහ (ආ) වගන්ති වලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්, සහ භාණ්ඩාගාර ලේකම් එස්. ආර්. ආටිගල මහතා, පිළිවෙලින් 2019 දෙසැම්බර් මස 21 වන දින සහ 2019 නොවැම්බර් මස 20 වන දින සිට නිළ බලයෙන් මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස පත් වන ලදී.

**11. ස්වධීන කොමිෂන් සභාවල පළමු වසර තුන ඇගයීම**

ස්වාධීන කොමිෂන් සභාවල කාර්යභාරය පිළිබඳ සිදු කරන ලද ජාතික සම්මන්ත්‍රණ දෙකෙහි ප්‍රතිපලයක් ලෙස, ව්‍යවස්ථා අධ්‍යයන ආයතනය විසින් ස්වාධීන කොමිෂන් සභාවන් හී පළමු වසර තුන පිළිබඳ පූර්ණ සවිස්තරාත්මක ඇගයීමක් සිදු කරන ලදී. ව්‍යවස්ථා අධ්‍යයන ආයතනය විසින් පත් කරන ලද මුදල් කොමිෂන් සභාවේ හිටපු සභාපති අශෝක ගුණවර්ධන මහතා විසින් එම අධ්‍යයනය මෙහෙයවන ලදී.

මෙම කාර්යයේදී ගුණවර්ධන මහතා විසින් මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වූ අතර ඔහුගේ වාර්තාව 2019 ඔක්තෝම්බර් මාසයේදී ව්‍යවස්ථා අධ්‍යයන ආයතනයට ඉදිරිපත් කරන ලදී.

## 12. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය

පුනරාවර්තන වියදම් සඳහා වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) මෘදුකාංග සංවර්ධන ආයතනය වන "තීක්ෂණ" විසින් මෘදුකාංගයේ අවසාන අනුවාදය, ප්‍රභව කේතය සහ පරිශීලක අත්පොත සමඟ මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. තවදුරටත් පරිශීලක අත්පොතෙහි සංශෝධන සිදු කිරීමට අවශ්‍ය බැවින්, එය නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස එම ආයතනයෙන් ඉල්ලීම් කරන ලදී. ඒ සඳහා "තීක්ෂණ" සහ මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය එක්ව මුදල් කොමිෂන් සභාවේ අවශ්‍යතාවය සමඟ පද්ධතියේ අනුකූලතාවය සනාථ කිරීමේ රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

ආසියා පදනමේ උපදෙස් පරිදි, අමතර පිරිවැයකින් තොරව මෘදුකාංගයේ අවශ්‍ය නිවැරදි කිරීම් සහ වෙනස් කිරීම් සිදු කිරීමට "තීක්ෂණ" ආයතනය සමඟ සය මසක කාලයක් සඳහා ගිවිසුමකට එළඹීමට මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලද අතර එය සලකා බලා 2020 ජනවාරි මාසයේදී අදාළ ගිවිසුමට අත්සන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මුදල් කොමිෂන් සභාව විසින් පද්ධති සංවර්ධන ආයතනයේ සහාය ඇතිව 2020 වර්ෂය සඳහා වූ පළාත් පුනරාවර්තන අයවැය ඇස්තමේන්තු තක්සේරු කිරීම කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතයෙන් සිදු කරන ලදී.

## 13. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත

2019 සැප්තැම්බර් මස 11 වන දින නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවති සාකච්ඡාවේ දී එකඟ වූ පරිදි, මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පතේ සංශෝධිත කෙටුම්පත 2019 ඔක්තෝබර් 03 වන දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

2019 නොවැම්බර් මස 04 වන දින පැවති මුදල් කොමිෂන් සභාවේ අනු කමිටු රැස්වීමේදී, මුදල් කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යභාර්ය ඉටු කිරීමට අදාළ ප්‍රමාණවත් බලතල ඇතුලත් කරමින් පනත් කෙටුම්පත සංශෝධනය කරන ලද අතර සංශෝධිත කෙටුම්පත 2019 නොවැම්බර් 05 වන දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

පනත් කෙටුම්පතෙ හී ඇතුළත් කර ඇති ප්‍රධාන කොටස් පහත පරිදි වේ;

- 1 වන කොටස : කොමිෂන් සභාවේ බලතල
- 2 වන කොටස : මුල්‍යානය
- 3 වන කොටස : කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය
- 4 වන කොටස : කොමිෂන් සභාවේ පැවැත්ම හා ක්‍රියාපටිපාටි
- 5 වන කොටස : පොදු

## 14. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම විගණන කමිටු රැස්වීම් සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ද සහභාගී විය. රැස්වීමේ දී ගන්නා ලද තීරණ අවශ්‍ය පසු විපරම් කටයුතු සඳහා මුදල් කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලයට දැනුම් දෙන ලදී. මේ සම්බන්ධයෙන්, නිත්‍ය වශයෙන් සලකා බලන කරුණු වලට අමතරව කාර්යාලයේ කාර්යසාධන කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීමේ වැදගත්කම කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන අංශයට පෙන්වා දෙන ලදී.

## 15. පළාත් විගණන වාර්තා පිළිබඳ කොමිෂන් සභාවේ සමාලෝචන හා නිරීක්ෂණ

සියලුම පළාත් සභාවල 2018 මුදල් වර්ෂයට අදාළව ජාතික විගණන කාර්යාලයෙන් නිකුත් කරන ලද විගණන වාර්තා 2019 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාවට ලැබුණි. මෙම විගණන වාර්තා සමාලෝචනය කර විශේෂයෙන් අවධානය යොමුකළ යුතු කරුණු කොමිෂන් සභා රැස්වීමේදී සභාගත කරන ලද අතර එහි නිරීක්ෂණ පසු විපරම් කටයුතු සඳහා පිළිවෙලින් අදාල පළාත්වල ගරු ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, අභ්‍යන්තර, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

## 16. මුදල් කොමිෂන් සභාවේ අනුකූලතා වාර්තාව

මුදල් කොමිෂන් සභාව විසින් එහි ක්‍රියාකාරීත්වයට අවශ්‍ය සියලු අනුකූලතා සපුරාලීම සහතික කරයි. මේ සම්බන්ධයෙන් අනුකූලතා වාර්තා මාසිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## 17. මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම සංශෝධනය කිරීම

මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්මේ නවතම අනුවාදය සමාලෝචනය කර නැවත සකස් කරන ලදි. මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මේ පිළිබඳව සාකච්ඡා මාලාවක් පැවැත්වූ අතර උපායමාර්ගික සැලැස්මේ නව අනුවාදයේ කෙටුම්පත කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 18. ආයතනික සංවර්ධනය හා වැඩ අධ්‍යයනය

ආසියා පදනම විසින් සපයන ලද උපදේශකවරයකු විසින් මුදල් කොමිෂන් සභාවේ වැඩ අධ්‍යයන අභ්‍යාසය සියලු මට්ටම්වල කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් සිදු කරන ලදී. උපදේශකවරයා විසින් වැඩ අධ්‍යයනයේ අවසන් වාර්තාව සකස් කරමින් පවතින අතර අවසන් වාර්තාව 2020 ජනවාරි මාසයේදී මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

## 19. මානව සම්පත් ප්‍රතිපත්තිය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව, පරිපාලන අංශය විසින් කාර්ය මණ්ඩලයේ වඩා හොඳ කාර්යසාධනයක් සමඟ කුසලතා සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා 2019 වර්ෂයේ මුදල් කොමිෂන් සභාවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කරන ලදි. සංශෝධිත උපායමාර්ගික සැලැස්මට අනුව මෙය සමාලෝචනය කෙරේ.

## 20. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය

2019 වර්ෂයේ දෙවන කාර්තුවේදී මුදල් කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියක් සකස් කර ඇත. මෙම ප්‍රඥප්තිය මුදල් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අනුගමනය කළ යුතු මෙහෙවර, විෂය පථය, අධිකාරියමය බලය, ස්වාධීනත්වය, වගකීම සහ ආචාර ධර්ම පද්ධතිය යනාදිය සඳහා මාර්ගෝපදේශ සපයනු ලබයි.

## 21. 2020 වර්ෂය සඳහා පළාත් අයවැය පිළිබඳ සාකච්ඡාව

2020 වර්ෂය සඳහා වූ පළාත් අයවැය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සියලු පළාත් ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ (මුල්‍ය) සහභාගීත්වයෙන් මුදල් කොමිෂන් සභාව 2019 නොවැම්බර් 14 වන දින රැස්වීමක් පවත්වන ලදී. මෙම රැස්වීම සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් දෙදෙනෙක් ඇතුළුව මුදල් කොමිෂන් සභාවේ ලේකම් සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහභාගී වූහ.

මෙම රැස්වීමේදී පහත සඳහන් ප්‍රධාන විෂයයන් පිළිබඳව සාකච්ඡා කෙරිණි.

1. අතුරු සම්මත ගිණුම අනුමත වීම හා ජාතික වාර්ෂික අයවැය සම්මත කර නොමැති වීම හේතු කොට ගෙන, 2020 වර්ෂය වෙනුවෙන් පළාත් සභා සඳහා වාර්ෂික අයවැය සකස් කිරීමේදී නිර්දේශිත ප්‍රතිපාදන ප්‍රමාණයන් සලකා බැලීම.
2. අතුරු සම්මත ගිණුම යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන භාවිතා කරමින් 2019 සහ 2020 වර්ෂවල අතැති බිල්පත් පියවීම.

## 22. 2020 වර්ෂය සඳහා වූ අතුරු සම්මත ගිණුම් පිළිබඳ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟ සාකච්ඡාව

2020 වර්ෂය සඳහා වූ අතුරු සම්මත ගිණුම් පිළිබඳ සාකච්ඡාවක් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2019 නොවැම්බර් මස 26 වන දින මුදල් කොමිෂන් සභාවේදී පැවැත්විණි.

මෙම සාකච්ඡාවේදී; පළාත් සභාවලට ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම, අතුරු සම්මත ගිණුම යටතේ ප්‍රතිපාදන වෙන් කිරීම, 2019 වර්ෂය සඳහා වූ අතැති බිල්පත් පියවීම සහ 2020 වර්ෂය සඳහා පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලදී.

## 23. ගරු පළාත් ආණ්ඩුකාරවරුන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡාව

ප්‍රාග්ධන වියදම් සඳහා රජය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ අත්මුදල් ලබා දීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සියලුම ගරු පළාත් ආණ්ඩුකාරවරුන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරු සමඟ රැස්වීමක් 2019 ජූලි 26 වන දින මුදල් කොමිෂන් සභාවේදී කැඳවනු ලැබීය. මෙම රැස්වීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති සමඟ තවත් සාමාජිකයෙක් හා ලේකම්වරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ද සහභාගී වූහ. නොවැළැක්විය හැකි තත්වයන් නිසා අනෙකුත් කොමිෂන් සභා සාමාජිකයින්හට මෙම අවස්ථාව සඳහා සහභාගී වීමට නොහැකි විය. අදාළ බලධාරීන් සමඟ කරුණු සලකා බැලීමේදී ඔවුන්ගේ යෝජනා සහ ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු සලකා බැලිය යුතුය යැයි ආණ්ඩුකාරවරු

ඒකමතිකව එකඟ වූහ. බලය පවරන ලද සහ සමගාමී වගකීම් යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත් සභාවලට රජයේ ප්‍රාග්ධන ප්‍රදානය වැඩි කිරීමේ අවශ්‍යතාවය පවතින බවත් අදාළ රේඛීය අමාත්‍යාංශවලට වෙන් කරනු ලබන අරමුදල්වලින් කොටසක් පළාත් සභා වෙත හරවා යැවීම සිදුවිය යුතු බවත් තවදුරටත් අවධාරණය කරන ලදී. මීට අමතරව, මෙම රැස්වීමේදී පහත කරුණු සාකච්ඡා කරන ලදී;

i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ 154 ජ (3) වගන්තියට අනුව මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය මත පදනම්ව රජය පළාත් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම අනිවාර්ය වේ.

ii) ජාතික අයවැය මඟින් පළාත් සඳහා අරමුදල් වෙන් කිරීමේදී මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය පිළිබිඹු විය යුතුය.

iii) මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන අරමුදල් ලබා ගැනීම සහ නියමිත වේලාවට මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර ගැනීම පළාත් සභාවේ වගකීම වේ.

iv) ජාතික අමාත්‍යාංශ විසින් විමධ්‍යගතකරන ලද විෂයයන් යටතේ විදේශ අරමුදල් මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් නියෝජිත ආයතනවල මැදිහත්වීමකින් තොරව එහි අරමුණු සඵලදායි ලෙස සාක්ෂාත් කරගත නොහැකිය. එබැවින් එකඟ වූ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක් තුළ පළාත් සභා හරහා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය.

v) ඍජු හා වක්‍ර බදු සියල්ලම පාහේ මධ්‍යම රජය විසින් එකතු කරනු ලැබුවද, පාර්ශව දෙකක් විසින් සේවා සැපයීමේ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් නිසි පරිදි රජය සහ පළාත් සභා අතර අරමුදල් බෙදා හැරිය යුතුය. ඒ අනුව 2020 සිට ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ජාතික අයවැයේ සමස්ත ප්‍රාග්ධන අයවැය වියදමෙන් 25% ක් වත් පළාත් සභා සඳහා ලබා දෙන ලෙස ගරු ආණ්ඩුකාරවරුන් විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

vi) ප්‍රමාණවත් අරමුදල් සඳහා ඔවුන්ගේ ව්‍යවස්ථාමය අයිතිවාසිකම් සහ රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් බලය බෙදා හරින ලද විෂයයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නීතිමය පැහැදිලි කිරීම් ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරවරු එකඟ වූහ.

vii) සියලුම ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ අනෙකුත් අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පළාත් සභාවලට අදාළ මූලික කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා සමඟ රැස්වීමක් සංවිධානය කිරීමට ගරු ආණ්ඩුකාරවරු යෝජනා කළහ.

## 24. පළාත් සභා පහක මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම

ඌව, වයඹ, උතුරු මැද, සබරගමුව සහ මධ්‍යම යන පළාත් සභා පහ විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) තාක්ෂණික සහයෝගය ඇතිව සකස් කරන ලද පස් අවුරුදු මධ්‍ය කාලීන තිරසාර සංවර්ධන සැලැස්මක් විශේෂඥ කමිටුවක් වෙත ඉදිරිපත් කරන ලදී. මෙම විශේෂඥ කමිටුව මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින්, ලේකම් ඇතුළුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්, තිරසාර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්, අදාල පළාත් සභාවල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයින් ඇතුළු නිලධාරි මණ්ඩලයකින් සමන්විත විය.

එය අදාල පළාත්වල සැලසුම් සමස්ත මධ්‍ය කාලීන සැලසුම් වශයෙන් පිළිගැනීමත් එම සැලසුම් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා එම විශේෂඥ කමිටුවෙන් අදහස් ලබාගැනීමත් සඳහා වූ මණ්ඩපයක් විය. මෙම සැලසුම් සකස් කිරීමේ උපදේශක මණ්ඩලය විශ්වවිද්‍යාල අධ්‍යයන සාමාජිකයින්ගෙන් හා පළාත් ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත විය.

## 25. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ කාර්යභාරය සකස් කිරීම

2019 මාර්තු 08 වන දින තුලිත ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. ඒ අනුව, මෙහෙයුම් කමිටුව විසින් සකස් කරන ලද යොමු කිරීමේ අනුදේශ (TOR) පාලන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. යෝජිත මෙම පාලන කමිටුව මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ ලේකම් ඇතුළුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ

ජනරාල්වරුන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගෙන් සමන්විත විය.

### 26. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සමඟ සිදු කරන ලද සාකච්ඡාව

ග්‍රාමීය ණය පහසුකම් පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් ශ්‍රී ලංකා මහ බැංකුවෙ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ 2019 මැයි 27 වන දින ශ්‍රී ලංකාවේ මහ බැංකුවේදී පැවැත්විණි. මෙම සාකච්ඡාවට මුදල් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරු සහභාගී වූහ. මූල්‍ය අන්තර්ගතභාවය, ග්‍රාමීය සංවර්ධනය සහ ග්‍රාමීය ණය පහසුකම් සහ පළාත් වැඩසටහන් සඳහා එහි අදාළත්වය යන විෂයයන් එහිදී ඵලදායි ලෙස සාකච්ඡා කෙරිණි.

### 27. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) සමඟ ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මුදල් කොමිෂන් සභාව හා එක්ව පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අදාළ පර්යේෂණ අධ්‍යයන කටයුතු සිදු කිරීම ආරම්භ කළේය. ඊට අදාළ යොමු කිරීමේ අනුදේශ (TOR) සංවර්ධනය කරන ලද අතර උපදේශක කණ්ඩායම් වලින් ලැබුණු යෝජනා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සහ මුදල් කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව ඇගයීමට ලක් කරන ලදී.

### 28. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය

මැදි ආදායම් හා ඉහළ ආදායම් ලබන අධ්‍යාපනික පද්ධතිවල ස්ථාපනය කර ඇති අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය නවීකරණය කිරීම හා පොදු ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපන ක්‍රමය ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින්, 2018 දී දියත් කරන ලද මෙම පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) සඳහා ලෝක බැංකුව විසින් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ප්‍රදානයක් ලබාදී ඇත. මෙම ව්‍යාපෘතිය 2018-2024 අතර කාලය තුළ ක්‍රියාත්මක කෙරේ.

ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ කළමනාකාරිත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති මෙහෙයවීම සහ තාක්ෂණික සහාය ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජිකයින් 48 දෙනෙකුගෙන් යුත් පාලන කමිටුවක් පත් කර ඇති අතර, මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා මෙම පාලන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. මෙම පාලන කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වනු ලැබේ.

### 29. නව පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සකස් කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ පළාත් මාර්ගවල ප්‍රවේශය සහ වත්කම් කළමනාකරණය වැඩිදියුණු කිරීමේ හා පළාත් මාර්ග ආයතනවල පද්ධතීන් සහ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් දෙකක් අන්තර්ගත වේ. එනම්, පළාත් මාර්ග වැඩසටහන් මූල්‍යකරණය, වත්කම් කළමනාකරණය, මාර්ග ආරක්ෂාව හා ආයතනික ශක්තිමත්භාවය ඇති කිරීම වේ. පළාත් මාර්ග වැඩසටහන් මූල්‍යකරණය යටතේ සියලුම පළාත්හි පළාත් ප්‍රමුඛතාගත මාර්ග කි.මී. 500 ක් පමණ ඉදිකිරීම සහ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම වසර 05 ක නඩත්තු කාලසීමාවක් යටතේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. වත්කම් කළමනාකරණය යටතේ මාර්ග ආරක්ෂව සහ ආයතනය ශක්තිමත් කිරීමේ අංග ඇතුළත් වන අතර, වත්කම් කළමනාකරණය හා මාර්ග ආරක්ෂාව සඳහා වූ සැලකිල්ල වැඩිදියුණු කිරීම මගින් කෘෂිකාර්මික / සැපයුම් හා වටිනාකම් දාමය සහ ආයතනික ධාරිතාව සඳහා සම්බන්ධතාවයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති සම්පාදනය හා සමාලෝචන රැස්වීම් සඳහා මුදල් කොමිෂන් සභාවේ නිලධාරීහු සහභාගී වූහ.

### 30. ශ්‍රී ලංකාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ රැස්වීම

2019 මැයි 16 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය එක්ව සකස් කරන ලද මාර්ගෝපදේශ සමාලෝචනය කිරීමේ අපේක්ෂාවෙන් මෙම සාකච්ඡාව ජනාධිපති කාර්යාලයේ දී පැවැත්විණි. එහිදී, වැඩිදුර සලකා බැලීම සඳහා සියලුම පළාත් කොමසාරිස්වරුන්ට ද ආරාධනා කිරීමට එකඟ විය.

### 31. පුරවැසි අයවැය (Citizen Budget)

නැගෙනහිර පළාත් සභාව විසින් යුනිසෙෆ් (UNICEF) හි සහාය ඇතිව පළමුවරට "පුරවැසි අයවැය" ඉදිරිපත් කර ඇති අතර එය 2019 නොවැම්බර් 6 වන දින උත්සවාකාරව ත්‍රිකුණාමලයේ දී දියත් කරන ලදී. පුරවැසි අයවැය මහජන වගවීම සහ ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා වැදගත් මෙවලමක් වන අතර, මෙමගින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා එය භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට පුරවැසියාට හැකියාව ලැබේ. මෙම සමාරම්භක උත්සවයට මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ ලේකම් සහභාගී වූහ.

## 32. පූර්ව ළමාවිය සංවර්ධන අංශය සඳහා සංරචක සහ උප සංරචක සකස් කිරීම පිළිබඳ වැඩමුළුව

මුදල් කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 4 වන දින මුල් ළමාවිය සංවර්ධනය අංශය සඳහා වන සංරචක සහ උප සංරචක සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම හා තීරණය කිරීම සඳහා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකවරුන්, හා පූර්ව ළමාවිය සංවර්ධන අංශයේ පළාත් ප්‍රධානීන්ගෙන් සහභාගීත්වයෙන් වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ඒ අනුව වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට ඇතුළත් කිරීමේ අරමුණින් පූර්ව ළමාවිය සංවර්ධන අංශය සඳහා  සංරචක සහ උප සංරචකවල වැඩි දියුණු කරන ලද අනුවාදයක් සකස් කරන ලදී.

## 33. පළාත් ක්‍රීඩා අංශය සංවර්ධනය පිළිබඳ රැස්වීම

2019 ජනවාරි මස 17 වැනි දින සියලුම පළාත්වලට අයත් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් සමඟ රැස්වීමක් මුදල් කොමිෂන් සභාවේදී පවත්වන ලද අතර මේ සඳහා ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද සහභාගි විය.

මෙම රැස්වීමේ අරමුණ වූයේ, අදාල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය  පසුබිමක්  සකස් කිරීමේදී පළාත් ක්‍රීඩා අංශ මුහුණ දෙන ගැටළු සහ දුෂ්කරතා පිළිබඳව සාකච්ඡා කිරීමට  අවස්ථාව ලබා දීමයි.

## 34. සමුපකාර, පරිවාස හා ළමාරක්ෂක, සමාජ සේවා සහ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ රැස්වීම්

මෙම රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ පෙර වසරවල ප්‍රගතිය සමාලෝචනය කිරීම, අදාල ගැටළු / අභියෝග සාකච්ඡා කිරීම හා අවශ්‍ය  නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

## 35. පළාත් සභා පාලන කටයුතු වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුව

පළාත් සභාවල පාලන කටයුතු වැඩිදියුණු කිරීම මැයෙන්, මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද එක්දින වැඩමුළුවක් 2019 මාර්තු මස 30 වන දින මුදල් කොමිෂන් සභාවේදී පවත්වන ලදී. සියලු පළාත් ප්‍රධාන ලේකම්වරු, නියෝජ්‍ය  ප්‍රධාන ලේකම්වරු (මූල්‍ය, සැලසුම්, ඉංජිනේරු, පරිපාලන හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම) සහ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරීහු මෙම වැඩමුළුව සඳහා සහභාගි වූහ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, භාණ්ඩාගාර ලේකම්, මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයෙක් සහ මුදල් කොමිෂන් සභාවේ හිටපු සභාපති අශෝක එස්. ගුණවර්ධන මහතා ද  මෙම දේශන හා සාකච්ඡාවලට සහභාගි වූහ.

## 36. ඵලදායී වාර්ෂික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා කොළඹ මහ නගර සභාවට පහසුකම් සැපයීම

බස්නාහිර පළාත් සභාවේ ඉල්ලීම පරිදි,  මුදල් කොමිෂන් සභාවේ ලේකම් හා ජ්‍යෙෂ්ඨ  නිලධාරීන් හා  බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැළසුම්) සහ නාගරික කොමසාරිස්  ඇතුළු  කොළඹ මහ නගර සභාවේ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් කොළඹ මහ නගර සභාව සඳහා ඵලදායී හා ව්‍යුහාත්මක වාර්ෂික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම පිළිබඳව සාකච්ඡවක් මුදල් කොමිෂන් සභාවේ දී පවත්වනු ලැබිය.

ඊට සමගාමීව නාගරික කොමසාරිස්වරයා විසින් ඔහුගේ කාර්යාලයේදී කොළඹ මහ නගර සභාවේ අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් එක් දින වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර ඒ සඳහා මුදල් කොමිෂන් සභාවේ  අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා පර්යේෂණ), අධ්‍යක්ෂ (සැලසුම්) සහ සහකාර අධ්‍යක්ෂ (අයවැය) සම්පත්ලාදායකයින් ලෙස සහභාගී වන ලදී. කොළඹ මහ නගර සභාවේ විෂය පථය යටතේ අදාළ සියලුම අංශ සඳහා සංරචක සහ උප සංරචක සහිත වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා ව්‍යුහාත්මක දළ සටහනක් මෙම වැඩමුළුවේදී සකස් කරන ලදී.

## 37. මානව සම්පත් සංවර්ධනය

### 37.1 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ආරාධිත දේශන නිතිපතා සංවිධානය කරනු ලැබේ. 2019 වර්ෂය තුළ දී මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ආරාධිත දේශකවරුන් විසින් පහත සඳහන් විශේෂිත මාතෘකා ඔස්සේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

| නම | මාතෘකාව | දිනය |
|---|---|---|
| මහාචාර්ය නලින් අබේසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - විවෘත විශ්ව විද්‍යාලය | වඩා හොඳ 2019 වර්ෂයක් සඳහා | 2019.01.01 |
| ආචාර්ය පී. විශාක හිදෙල්ලගේ | ශ්‍රී ලංකාවේ ආපදා තත්ත්ව | 2019.01.10 |
| මහාචාර්ය අජිත් ද අල්විස් | නිර්මාණාත්මක චින්තනය | 2019.05.24 |
| ආචාර්ය දිනේෂ් ආටිගල, ආචාර්ය ශාන්ත අමරසිංහ හා වේරගොඩ මයා - මොරටුව විශ්වවිද්‍යාලය | ද්‍රව්‍ය විද්‍යාව හා ආර්ථිකය | 2019.05.27 |
| ආචාර්ය අජිත් රෝහණ කොළොන්නේ | සාර්ථකත්වය | 2019.06.25 |
| ආචාර්ය චින්ද්‍යා ආරියරත්න | තුළිත ප්‍රාදේශීය සංවර්ධනය | 2019.09.19 |
| ආචාර්ය බාට් ක්ලෙම් | බලය විමධ්‍යගත කිරීම හා පළාත් සභා | 2019.10.31 |
| ලුයිස් මොරෙයිරා ඩැනියල්ස් මිය | පුරවැසි අයවැය | 2019.11.22 |
| තුල්සි අලුවිහාරේ මයා | කොළඹ වරාය නගර ව්‍යාපෘතිය හා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට එහි බලපෑම් | 2019.11.27 |
| ඒ. ජී. කේ. එම්. යු . ගමකුමාර මයා | මනෝ ක්‍රියාකාරී පරිසරය | 2019.12.04 |

### 37.2 කාර්ය මණ්ඩලය සහභාගී වූ පුහුණු වැඩසටහන්

2019 වර්ෂය තුළ දී පහත සඳහන් නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

- **දේශීය පුහුණු**

| නම | මාතෘකාව | කාලසීමාව |
|---|---|---|
| ඩබ්. ඩී. අයි. ඩී. ඉරේෂිකා මිය<br>විජිතා අබේවික්‍රම මිය | ගබඩා සහ භාණ්ඩ තොග කළමනාකරණය | 2019.04.25, 26 |
| එස්.එන්.සංජීවනී මිය | විධායක නිලධාරීන් සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි | 2019.06.06, 13, 20 |
| කේ. ඒ. එම්. ලංකානි මිය | රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි | 2019.07.18 - 2019.07.26 |
| ටී. අබේසේකර මිය<br>චන්ද්‍රා මාලනි මෙය<br>නිමාලි රත්නායක මිය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද ආර්ථික විද්‍යා පර්යේෂණ පිළිබඳ පුහුණුව | 2019.07.05 - 2019.09.06<br>(දක්වා වූ සෑම සිකුරාදා දිනකම) |
| එස්. ඩී. සී. චන්ද්‍රසිරි මයා | රාජ්‍ය වැටුප් සකස් කිරීමේ පරිගණක වැඩසටහන (Pay Roll) | 2019.09.04 - 06 |
| එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මයා | OPA ශ්‍රී ලංකා විසින් සංවිධානය කරන ලද SDGs පිළිබඳ වාර්ෂික සමුළුව | 2019.09.18 |
| එස්. එන්. සංජීවනි මිය | කාර්යසාධන ඇගයීම සහ මූලික කාර්යසාධන දර්ශක සැකසීම | 2019.11.25 |
| ටී. අබේසේකර මිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සැලසුම් සහ රෙගුලාසි | 2019.11.27-29 |
| නිලධාරීන් 34 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් | සංඛ්‍යාලේඛන හා සම්බන්ධ පරිගණක යෙදුම පිළිබඳ පුහුණුව | 2019.12.09 - 20 |
| එස්. ආර්. ඉඩම්පිටිය මිය<br>නදීකා දමයන්ති මය | විනය ක්‍රියා පටිපාටි | 2019.12. 18 - 20 |

- **විදේශ පුහුණු**

| නම | මාතෘකාව | කාලසීමාව |
|---|---|---|
| වී. මහේන්ද්‍රරාජා මයා | රටවල් අතර ස්ත්‍රී පුරුෂභාවය පදනම් වූ අයවැයකරණය පිළිබඳ අධ්‍යයන වැඩමුළුව - ගෝව, ඉන්දියාව | 2019.09.11-12 |
| පී. ආර්. එන්. සුජීව මයා | චීනයේ සංවර්ධන අත්දැකීම් සහ ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සඳහා ඇති අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 2019.09.02- 2019.10.01 |
| ටී. ජී. සී. මාලනී මෙය<br>ඒ. ඩබ්. කේ. එස්. රණසිංහ මිය | 2019 සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාව පිළිබඳ අමාත්‍ය වැඩමුළුව - චීනය | 2019.09.18- 2019.09.24 |
| එස්. එම්. ආර්. එස්. බංඩාර මයා | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සංවර්ධන මූල්‍යකරණය සහ ජාත්‍යන්තර දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ අමාත්‍ය වැඩමුළුව - චීනය | 2019.10.15 - 24 |

**38. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සහ ස්ථාන මාරුවීම්**

2019 වර්ෂයේ දී, පහත සඳහන් නිලධාරීහු මුදල් කොමිෂන් සභාව හා සම්බන්ධ වූහ.

| නම | තනතුර | සම්බන්ධ වූ දිනය |
|---|---|---|
| වී. මහේන්ද්‍රරාජා මයා | අධ්‍යක්ෂ | 2019.01.01 |
| එස්. ඩී. සී. චන්ද්‍රසිරි මයා | ගණකාධිකාරී | 2019.06.25 |
| එස්. ඒ. හංසනී සඳමාලි මෙය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2019.07.01 |
| එස්. කේ. කොතලාවල මිය | ප්‍රධාන ගණකාධිකාරී | 2019.07.02 |
| ඩී. වී. යූ. ගුණවර්ධන මයා | කාර්යාල සහයක - අනියම් | 2019.08.01 |
| එස්. පී. පී. විජේසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ | 2019.12.12 |
| කේ. පී. ඩී. නන්දන මයා | රියදුරු | 2019.12.16 |

පහත සඳහන් නිලධාරියා මුදල් කොමිෂන් සභාවෙන් ස්ථාන මාරු වීමක් ලබා ගන්නා ලදී.

| නම | තනතුර | ස්ථාන මාරු වූ දිනය |
|---|---|---|
| 1. සුසන්ත රණසිංහ මයා | ප්‍රධාන ගණකාධිකාරී | 2019.07.02 |

මීට අමතරව, අභ්‍යාසලාභී උපාධිධාරීන් 15 දෙනෙකු 2019 අගෝස්තු මස 1 වන දින මුදල් කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලදී.

**39. කාර්ය මණ්ඩල අධ්‍යනයන්**

මුදල් කොමිෂන් සභාවේ රාජකාරි ඉටු කිරීමේ දී, එහි කාර්ය මණ්ඩලය විසින් අඛණ්ඩව අධ්‍යයනයන් / පර්යේෂණයන් සිදු කරනු ලබයි. මෙම වර්ෂය තුළ දී පහත සඳහන් අධ්‍යයනයන් සිදු කරන ලදී.

- මධ්‍යම රජයේ ආදායම් පළාත් සභාවලට මාරු කිරීම
- පළාත් සභා විසින් එකතු කරනු ලබන වක්‍ර ආදායම් (ජාතිය ගොඩනැගීමේ බදු)
- මුදල් කොමිෂන් සභාවේ පරිපාලන අංශය විසින් සකස් කරන ලද මුදල් කොමිෂන් සභාවේ මානව සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ කෙටුම්පත
- තුලිත ප්‍රාදේශීය සංවර්ධනය - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ මුදල් කොමිෂන් සභාවේ හි භාවිතය

- පළාත් සැලසුම් ක්‍රියාවලිය - නැගෙනහිර පළාත් සභාවේ භාවිතය
- පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම පිළිබඳ අධ්‍යයනය
- භූගෝලීය සංවර්ධන සැලසුම් හා දරිද්‍රතාව පිළිබඳ සම්බන්ධතාවය
- රේඛීය අමාත්‍යාංශ මගින් සිදු කරනු ලබන, පළාත් අතර අයවැය ප්‍රතිපාදන බෙදාහැරීම පිළිබඳ අධ්‍යයනය
- තුලිත ප්‍රාදේශීය සංවර්ධන දර්ශක පිළිබඳ අධ්‍යයනය
- එක් එක් අංශ සඳහා අරමුදල් වෙන් කිරීම සඳහා තාර්කික දර්ශක සංවර්ධනය කිරීම
- භූගෝලීය සංවර්ධන සැලසුම් හා දරිද්‍රතාව අතර සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය
- සෞඛ්‍ය හා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධ්‍යයන

## 40. ආංශික අධ්‍යයනයන් සහ ඉදිරිපත් කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභාවලට රජයේ ප්‍රදානයන් යටතේ ඇති අරමුදල් බෙදා වෙන් කිරීම සහ පළාත් සභා විෂය පථයන්ට අයත් අංශ 23 ක වැඩසටහන් ඇතුළත් පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා මූල්‍ය සම්පාදනය සඳහා අවශ්‍ය නිර්දේශ කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා එක් එක් අංශයේ විභවයන්, වර්තමාන තත්ත්වය, කාර්යසාධනය සහ ආයෝජන පිළිබඳ අධ්‍යයනයන් මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

මේ කාර්යය ඉටු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සහකාර පර්යේෂණ නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ උපාධිධාරී අභ්‍යාසලාභීන්ට අධ්‍යයන කටයුතු සිදු කිරීම සහ සොයාගැනීම් ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත අංශ පවරා ඇත. මෙම කාර්යයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අදාළ අංශ පිළිබඳ මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ කුසලතා හා ධාරිතාව ඉහළ නැංවීම සහ කොමිෂන් සභාවේ තීන්දු තීරණ හා උපදෙස් සඳහා මෙය යොදා ගැනීමයි. ඒ අනුව, 2019 වර්ෂයේ සිව්වන කාර්තුවේදී අදාළ නිලධාරීන් විසින් ඉදිරිපත් කිරීම් සිදු කරන ලද අතර, අදාළ අංශවල මාර්ගෝපදේශ හා නිර්දේශ සකස් කිරීමේදී අනුගමනය කිරීමට ප්‍රයෝජනවත් තොරතුරු සහ සොයා ගැනීම් එහිදී හඳුනා ගන්නා ලදී.

## 41. කමිටු තාර්කිකකරණය

කොමිෂන් සභාවේ කටයුතු විධිමත් කිරීම සහ කාර්ය මණ්ඩලය, විශේෂයෙන් තාක්ෂණික කාණ්ඩයම වඩාත් සඵලදායී බවට පත් කිරීමේ අරමුණින්, කොමිෂන් සභාවේ පරිපාලන හා මූල්‍ය කටයුතු සම්බන්ධ කමිටු තාර්කික කිරීම සඳහා වහාම ක්‍රියාත්මක විය යුතු බව කොමිෂන් සභාවේ තීරණය විය.

## 42. ඵලදායිතාව වැඩි දියුණු කිරීම

මුදල් කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාව සහ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීමේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු කර ඇත. ඒ අනුව කොමිෂන් සභාවේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමේ විභවය සැලකිල්ලට ගනිමින් සියලුම අධ්‍යක්ෂවරුන් විසින් මෙම අංගය නිසි ලෙස අධ්‍යයනය කළ යුතු යැයි තීරණය විය. මේ සම්බන්ධයෙන් කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

## 43. මුදල් කොමිෂන් සභා රැස්වීම්

- වර්ෂය තුළ දී කොමිෂන් සභා රැස්වීම් එකොළහක් පවත්වන ලදී.
- කොමිෂන් සභාවේ අනු කමිටුව සෑම කොමිෂන් සභා රැස්වීමකටම සහ වෙනත් විශේෂ සාකච්ඡාවකට පෙර රැස්විය.
- සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම පැවැත්විය.
- කාර්ය මණ්ඩල රැස්වීම් ද නියමිත පරිදි පවත්වන ලදී.

## 44. කොමිෂන් සභා රැස්වීම්වලදී ගනු ලැබූ වැදගත් තීරණ

- පළාත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා නිර්දේශ අනුමත කිරීම - 2020
- ප්‍රාග්ධන වියදම් බෙදා හැරීම සඳහා සංයුක්ත දර්ශකයේ දරිද්‍රතා අනුපාතය වෙනුවට දරිද්‍රතා රේඛාවට පහළ ජනගහනය භාවිතා කිරීම
- පළාත් සභා විසින් ඔවුන්ගේ ආදායම් වැඩිකර ගැනීම සඳහා, මුදල් කොමිෂන් සභාවේ සහාය ඇතිව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ආදායම සහ ඒකාබද්ධ පර්යේෂණ වැඩි කර ගැනීමේ මාර්ග සහ ක්‍රම සොයා ගැනීම
- 2020 සිට පළාත් සභා විසින් ඔවුන්ගේ අරමුදල් ඉල්ලීම ඉදිරිපත් කරන විට ආදායම් වැඩි දියුණු කිරීමේ යෝජනාවන් කැඳවීම
- මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ 2020

- පළාත් අයවැය සඳහා න්‍යායන් සංවර්ධනය කිරීම
- කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් මහ නගර සභාවල මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු
- පළාත් සභා ක්‍රමයට එරෙහිව පුවත්පත් ලිපිවල විවේචන
- ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කිරීම හේතුවෙන් පළාත් මූල්‍යනයට ඇති බලපෑම
- වැඩ අධ්‍යයනය පිළිබඳ අතුරු වාර්තාව
- ස්වාධීන කොමිෂන් සභාව ඔවුන්ගේ පළමු වසර තුන තුළ ඇගයීම: තොරතුරු රැස් කිරීමේ මෙවලම්

## 45. අනු කමිටු රැස්වීම්වලදී ගනු ලැබූ වැදගත් තීරණ

- අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා අංශ රැස්වීම සංවිධානය කිරීම
- ඒකාබද්ධ සැලසුම් පද්ධතිය පිළිබඳ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ රැස්වීම
- මුදල් කොමිෂන් සභාවේ ගුණාත්මක සංවර්ධනය
- මානව සම්පත් සැලැස්ම සකස් කිරීම
- අරමුදල් වෙන් කිරීම සඳහා එක් එක් අංශ සඳහා තාර්කික දර්ශක සංවර්ධනය කිරීම
- මූල්‍ය ඇතුළත් කිරීම් සම්බන්ධ රැස්වීම
- පළාත් හා සම්බන්ධව රේඛීය අමාත්‍යාංශ විසින් දරනු ලබන වියදම් තීරණය කිරීම
- මානව සම්පත් අවශ්‍යතාව තක්සේරු කිරීම
- ඇගයීම් අංශ සඳහා තාර්කික දර්ශක ඉදිරිපත් කිරීම
- මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත
- භූගෝලීය පසුබිම, දරිද්‍රතාවය, සංවර්ධනය සහ සැලසුම්කරණය අතර අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ලිපිය
- පළාත් ප්‍රාග්ධන වියදම් එදිරිව පුනරාවර්තන වියදම්
- බලශක්ති විගණනය
- වාර්ෂික සංවර්ධන සැලසුම් මාර්ගෝපදේශය සකස් කිරීම - 2020

## 46. මුදල් කොමිෂන් සභාව සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම

2019 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 74.91 ක් වෙන් කරන ලද අතර, පුනරාවර්තන වියදම් සඳහා භාවිතා කරන ලද ප්‍රතිශතය 94% කි. 2016 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි නව වැටුප් ව්‍යුහය (චක්‍රලේඛ අංක 03/2016) ක්‍රියාත්මක කිරීමත් සමඟ මූලික වැටුප්, අතිකාල සහ වෙනත් දීමනා වැඩිවීම හේතුවෙන් පුනරාවර්තන වියදම්වල සැලකිය යුතු කොටසක් පුද්ගලික පඩිනඩි නියෝජනය කරයි.

පුනරාවර්තන වියදම් හැරුණු විට ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 119.39 ක් වෙන් කර ඇත. ප්‍රාග්ධන වියදම්වල උපයෝගීතා අනුපාතය 95% කි. නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගෙවීම ප්‍රාග්ධන වියදමෙන් සැලකිය යුතු කොටසක් නියෝජනය කරයි.

2019 සහ 2018 වර්ෂ සඳහා අයවැයගත වියදම සහ සත්‍ය වියදම් පහත පරිදි වේ.

| වැය විෂය | අයිතම විස්තරය | 2019 (Rs. 000) | | | | 2018 (Rs. 000) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ඉතිරිය | සත්‍ය වියදම ඇස්තමේන්තුවේ % ලෙස | ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ඉතිරිය | සත්‍ය වියදම ඇස්තමේන්තුවේ % ලෙස |
| | **පුනරාවර්තන වියදම්** | **74,910** | **70,609** | **4,340** | **94%** | **58,350** | **55,984** | **2,366** | **96%** |
| | **පුද්ගල පඩිනඩි** | **41,700** | **40,741** | **959** | **98%** | **35,100** | **33,853** | **1,247** | **96%** |
| 1001 | වැටුප් හා වේතන | 28,700 | 28,354 | 346 | 99% | 23,400 | 23,116 | 284 | 99% |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,200 | 1,098 | 102 | 92% | 600 | 579 | 21 | 97% |
| 1003 | වෙනත් දීමනා | 11,800 | 11,289 | 511 | 96% | 11,100 | 10,158 | 942 | 92% |
| | **ගමන් වියදම්** | **1,000** | **894** | **106** | **89%** | **630** | **604** | **26** | **96%** |
| 1101 | දේශීය | 450 | 415 | 35 | 92% | 200 | 174 | 26 | 87% |
| 1102 | විදේශීය | 550 | 479 | 71 | 87% | 430 | 430 | 0 | 100% |
| | **සැපයීම්** | **4,528** | **4,251** | **277** | **94%** | **3,640** | **3,517** | **123** | **97%** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය | 1,550 | 1,443 | 107 | 93% | 1,100 | 1,099 | 1 | 100% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අවශ්‍යතා | | | | | | | | |
| 1202 | ඉන්ධන | 2,400 | 2,241 | 159 | 93% | 2,250 | 2,130 | 120 | 95% |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 28 | 28 | 0 | 100% | 40 | 40 | 0 | 100% |
| 1205 | වෙනත් සැපයුම් | 550 | 539 | 11 | 98% | 250 | 248 | 2 | 99% |
| | **නඩත්තු වියදම්** | **4,652** | **3,316** | **1,336** | **71%** | **2,100** | **2,057** | **43** | **98%** |
| 1301 | වාහන | 1,900 | 1,751 | 149 | 92% | 1,500 | 1,468 | 32 | 98% |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,452 | 1,007 | 445 | 69% | 600 | 589 | 11 | 98% |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තුව | 1,300 | 558 | 742 | 43% | 0 | 0 | 0 | 0% |
| | **සේවා** | **22,030** | **20,659** | **1,371** | **94%** | **16,080** | **15,172** | **908** | **94%** |
| 1401 | ප්‍රවාහන | 3,800 | 3,715 | 85 | 98% | 3,300 | 3,240 | 60 | 98% |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 2,000 | 1,643 | 357 | 82% | 1,500 | 1,364 | 136 | 91% |
| 1403 | විදුලිය සහ ජලය | 6,300 | 5,921 | 379 | 94% | 2,500 | 2,221 | 279 | 89% |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 820 | 805 | 15 | 98% | 1,320 | 1,320 | 0 | 100% |
| 1406 | කල්බදු වාහන සඳහා පොළී | 810 | 809 | 01 | 100% | - | - | - | - |
| 1409 | වෙනත් (සේවාවන්) | 8,300 | 7,766 | 534 | 94% | 7,460 | 7,027 | 433 | 94% |
| | **මාරුකිරීම්** | **1,000** | **748** | **252** | **75%** | **800** | **782** | **18** | **98%** |
| 1506 | ණය වාරික සඳහා පොළී | 1,000 | 748 | 252 | 75% | 800 | 782 | 18 | 98% |
| | **මුල්ධන වියදම්** | **119,390** | **113,119** | **6,191** | **94%** | **310,950** | **217,495** | **93,455** | **70%** |
| | **මුලධන වත්කම්වල පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම** | **1,300** | **408** | **892** | **31%** | **2,050** | **1,568** | **482** | **76%** |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300 | 0 | 300 | 0% | 300 | 278 | 22 | 93% |
| 2003 | වාහන | 1,000 | 408 | 592 | 41% | 1,750 | 1,290 | 460 | 74% |
| | **මුල්ධන වත්කම් අත්පත් කර ගැනීම** | **116,090** | **111,953** | **4,137** | **96%** | **307,850** | **214,903** | **92,947** | **70%** |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 9,500 | 7,343 | 2,157 | 77% | 2,500 | 2,470 | 30 | 99% |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,700 | 3,729 | 1,971 | 65% | 18,500 | 18,470 | 30 | 100% |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 100,000 | 100,000 | 0 | 100% | 286,850 | 193,963 | 92,887 | 68% |
| 2108 | කල්බදු වාහන සඳහා ප්‍රාග්ධන ගෙවීම | 890 | 881 | 9 | 99% | - | - | - | - |
| | **මානව සම්පත් සංවර්ධනය** | **2,000** | **838** | **1,162** | **42%** | **1,050** | **1,024** | **26** | **98%** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 2,000 | 838 | 1,162 | 42% | 1,050 | 1,024 | 26 | 98% |

"රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම" පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත. ඒ අනුව, බලයලත් සීමාවන් තුළ ක්‍රියාත්මක වීමට මුදල් කොමිෂන් සභාවට හැකි වී තිබේ.

| **විස්තරය** | **2019** (රු.) | | **2018** (රු.) | |
|---|---|---|---|---|
| | **අනුමත සීමාව** | **සත්‍ය සීමාව** | **අනුමත සීමාව** | **සත්‍ය සීමාව** |
| උපරිම වියදම් සීමාව | 3,200,000.00 | 3,071,691.40 | 3,200,000.00 | 2,999,593.50 |
| අවම ලැබීම් සීමාව | 1,400,000.00 | 2,578,449.98 | 1,000,000.00 | 1,923,284.07 |
| උපරිම හර සීමාව | 13,000,000.00 | 9,927,441.22 | 13,000,000.00 | 9,359,711.28 |